සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# අවසන් පෙරහුරු පරීක්ෂණය (2022-2023)

**ඉතිහාසය - I** **කාලය : පැය එකයි**

උපදෙස් :
- සියළු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රයට ලකුණු 80 ක් හිමි වේ.
- අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1) , (2) , (3) , (4) පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් නිවැරදි පිළිතුර තෝරා ඔබට සපයා ඇති පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් තෝරා ගත් පිළිතුරේ අංකයට අදාළ කවය තුළ (×) ලකුණ යොදන්න.

(01) ක්‍රිස්තු වර්ෂ හතරවන සියවසේදී පමණ මෙරට රචනා වූ දේශීය සාහිත්‍ය මූලාශ්‍රය මින් කුමක්ද?
1. මහාවංශය 2. දීපවංශය 3. නිකාය සංග්‍රහය 4. පූජාවලිය

(02) ඓතිහාසික මූලාශ්‍රයක් ලෙස මහාවංශය වඩා විශ්වාසනීය කෘතියක් ලෙස හැඳින්වීමට වඩාත්ම ගැළපෙන පිළිතුර මින් කුමක් ද?
1. පුරාවිද්‍යා වැනි වෙනත් මූලාශ්‍ර මගින් මහාවංශයේ තොරතුරු සනාථ වීම.
2. අඛණ්ඩ වූ ලිඛිත ඉතිහාසයක් පිළිබඳ තොරතුරු අනාවරණය වීම.
3. වෙනත් මූලාශ්‍ර වලද තොරතුරු පදනම් කරගෙන රචනා වී තිබීම.
4. වැඩි වශයෙන් ආගමික තොරතුරු වලට මුල්තැන දීම.

(03) පහත විදේශ සාහිත්‍ය මූලාශ්‍ර (i) තීරුවෙන් ද එම මූලාශ්‍ර රචනා කළ පුද්ගලයින් (ii) තීරුවෙන් ද දැක්වේ. (i) තීරුවේ අනුපිළිවෙල අනුව (ii) තීරුව නිවැරදිව ගැලපූවිට නිවැරදි පිළිතුර කුමක්ද?

| I තීරුව | II තීරුව |
|---|---|
| 1. එදාහෙලදිව කෘතිය. | A ක්ලොඩියස් ටොලමි |
| 2. ඩිමුන්ඩෝ කෘතිය | B ඇරිස්ටෝටල් |
| 3. නැචුරලිස් හිස්ටෝරියා කෘතිය | C රොබට්නොක්ස් |
| 4. භූගෝල ශාස්ත්‍ර ප්‍රවේශය | D ප්ලිනි |

1. ABCD 2. CBAD 3. CADB 4. CBDA

(04) ක්‍රිස්තු වර්ෂ දෙවන සියවසෙන් පසු මෙරට බිහි වූ සෙල්ලිපිවල දැක්වෙන ප්‍රධාන තොරතුරක් දැක්වෙන නිවැරදි පිළිතුර මින් කුමක් ද?
1. පැරණි සමාජ ඉතිහාසය 2. පැරණි ජනාවාස ව්‍යාප්තිය
3. බදු අය කිරීම 4. භික්ෂූන්ට ලෙන් පිදීම

(05) පොළොන්නරු රාජධානි සමයේ භාවිතා වූවා යැයි සැළකෙන කාසියකට උදාහරණයක් වන්නේ මින් කුමක් ද?
1. කඩමස්ස 2. ලක්ෂමී කාසිය 3. අකනම් රන්කාසිය 4. තඹමස්ස

(06) ප්‍රාග් ඓතිහාසික මානවයා ජීවත් වූ විවිධ පරිසර කලාප වෙන්කිරීමේදී සැලකිල්ලට ගනු ලබන ප්‍රධාන ලක්ෂණය මින් කුමක් ද?
1. පසේ සාරවත් බව 2. වාර්ෂික වර්ෂාපතන වෙනස්කම්
3. හිතකර දේශගුණික තත්ව 4. ස්වභාවික සම්පත්වල ව්‍යාප්තිය

(07) පූර්ව ඓතිහාසික යුගයේ කාන්තාවගේ රූසපුව අලංකරණය කිරීම සඳහා විවිධ ක්‍රම භාවිත කළ බව පුරාවිද්‍යාත්මක තොරතුරු හමුවන ස්ථානයක් වන්නේ මින් කුමක් ද?
1. හල්දුම්මුල්ල 2. බෙරගල 3. උඩරංචාමඩම 4. ඉබ්බන්කටුව

(08) ශ්‍රී ලංකාවේ මුල් ඓතිහාසික යුගයේ ජනාවාස ව්‍යාප්ත වූයේ පහත කුමන දේශගුණයක් පැවැති ප්‍රදේශවලද?
1. වෙරළ කලාපීය ප්‍රදේශවල 2. අතරමැදි වියළි කලාපීය ප්‍රදේශවල
3. ශුෂ්ක කලාපීය ප්‍රදේශවල 4. වියළි කලාපීය ප්‍රදේශවල

- අතීත මූලාශ්‍රවල පැරණි ජනාවාස හඳුන්වා ඇති නම් කිහිපයක් පහත දැක්වේ. ඒ අතරින් ප්‍රශ්න අංක 9 හා 10 සඳහා පිළිතුරු සපයන්න.

A ඔලගම් B පරිකිත්තගම් C නියම්ගම් D කසීකාරගම්
E කේවට්ටගාම

(09) අතීතයේ ගොවිතැන් කටයුතුවල නියැලුණ සහ වෙළදාම් කටයුතු සිදුකල ගම් දැක්වෙන්නේ කවර පිළිතුරේ ද?
1. B හා A 2. C හා B 3. D හා C 4. E හා D

(10) අතීතයේ අතහරින ලද ගම් දැක්වෙන්නේ කුමන පිළිතුරේ ද?
1. A 2. B 3. C 4. D

- **අතීත පාලකයින් සම්බන්ධ ඓතිහාසික තොරතුරු කිහිපයක් පහත දැක්වේ. එම තොරතුරු උපයෝගී කරගෙන ප්‍රශ්න අංක 11 හා 12 සදහා පිළිතුරු සපයන්න.**

A. විශාල වැව් තැනවීමේ පුරෝගාමියා
B. මුළු දිවයිනේම අනසක පැවැත්වීම
C. චෝල පාලනයෙන් පොළොන්නරුව මුදවා ගැනීම
D. අනුරාධපුරය අංග සම්පූර්ණ නගරයක් බවට පත් කිරීම.

(11) වසභ රජු සම්බන්ධ නිවැරදි පිළිතුර තෝරන්න.
1. A හා B සත්‍ය වේ. 2. A හා D සත්‍ය වේ. 3. A සත්‍ය වන අතර B අසත්‍ය වේ.
4. B හා D සත්‍ය වේ.

(12) පළමු විජයබාහු රජු සම්බන්ධ නිවැරදි ප්‍රකාශය තෝරන්න.
1. A සත්‍ය වේ. 2. B හා C සත්‍ය වේ.
3. C සත්‍ය වන අතර D අසත්‍ය වේ 4. B අසත්‍ය නොවේ.

(13) අතීතයේ සිට මෙරට නගරවල විවිධ සංස්කෘතීන්ට අයත් ජන කොටස් වාසය කර තිබේ. A හා B තීරුවල දැක්වෙන්නේ එම ජාතීන් සහ ඔවුන් පැමිණි ප්‍රදේශයයි. A තීරයට අනුව B තීරය පිළිවෙලින් ගැලපූ විට නිවැරදි පිළිතුර කුමක් ද?

| | A තීරය | B තීරය |
|---|---|---|
| i. | දෙමළ වෙළෙඳුන් | මලය අර්ධද්වීපය |
| ii. | අයෝනියන්වරු | ඇෆ්ගනිස්ථානය |
| iii. | කාමබෝජවරු | ග්‍රීක් මැසිඩෝනියන් |
| iv. | ජාවකවරු | දකුණු ඉන්දියාව |

1. ADCB 2. DCBA 3. DBCA 4. DABC

❖ ජල කළමණාකරණය පිළිබඳ පහත තොරතුරු උපයෝගිකරගෙන ප්‍රශ්න අංක 14 හා 15 සඳහා පිළිතුරු සපයන්න.

| වාරි නිර්මාණය | ජලය ගෙන යන වාරි කර්මාන්තය | ඉදිකල රජු |
|---|---|---|
| A ඇලහැර ඇළ | D පරාක්‍රම සමුද්‍රය | G ධාතුසේන රජු |
| B යෝධ ඇල | E මින්නේරිය ජලාශය | H වසභ රජු |
| C අංගමැඩිල්ල ඇල | F තිසා වැව | I පරාක්‍රමබාහු රජු |

(14) සියුම් බෑස්මක් අනුව ඉතා දිගු දුරකට ජලය ගෙන යාමට ඉදිකල ඇළමාර්ගයක් සම්බන්ධ නිවැරදි පිළිතුර තෝරන්න.
1. AFG 2. BEH 3. CEI 4. BFG

(15) මහවැලි ගඟේ අතුගංගාවක් වූ අඹංගඟ හරස් කර විශාල වැව් ප්‍රමාණයකට ජලය ගෙන යාමට ඉදිකල ඇලමාර්ගය සම්බන්ධව නිවැරදි පිළිතුර තෝරන්න.
1. AEH 2. BFH 3. CEI 4. ADI

(16) "පරමාණු 36 = අණු එකයි" යන මිණුම් ක්‍රමය අතීතයේ භාවිතා කලේ කුමක් මැණීමට ද?
1. බර මැනීම 2. වපසරිය මැනීම 3. කෙටි දුර මැනීම 4. කාලය මැනීම

(17) අතීත සමාජ සංවිධානයේ කැපී පෙනෙන ලක්ෂණයක් වන්නේ පුද්ගල සම්බන්ධතාවල අනුපිළිවෙලක් තිබීමයි. එය හදුන්වන්නේ පහත කුමන නමකින් ද?

1. සමාජ ස්ථරායනය 2. තිරස් ධූරාවලිය 3. සිරස් ධූරාවලිය 4. සමාජ ධූරාවලිය

(18) නිසි කාලයට සී සෑම නොකරන පුද්ගලයින්ට කලං පහක දඩයක් නියමකල බව දැක්වෙන්නේ පහත කුමන ශිලා ලිපියේ ද?

1. මිහින්තලා පුවරු ලිපිය 2. බදුලු ටැම් ලිපිය
3. කොණ්ඩවට්ටවාන් ටැම් ලිපිය 4. ගල්පොත සෙල්ලිපිය

(19) "මධුපාවිකා" ලෙස දම්පියා අටුවා ගැට පදයේ විස්තර වන්නේ පහත කුමන කටයුත්තක නියැලුන කාන්තාවන් ද?

1. ප්‍රාදේශීය පාලනයේ නියුලුනු කාන්තාවන්
2. සූපශාස්ත්‍රය ප්‍රගුණ කල කාන්තාවන්
3. සිය රූ සපුව පිළිබඳ උනන්දු වුන කාන්තාවන්
4. මව්වරු ලෙස සිටි කාන්තාවන්

- **පහත තොරතුරු පදනම් කරගෙන පහත 20 - 21 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

A. කාලිංගමාග පරාජය කිරීම
B. බෙලිගල දළදා මැදුරක් ඉදි කිරීම.
C. දඹදෙණිය සිය පාලන මධ්‍යස්ථානය ලෙස තෝරා ගැනීම.
D. කව්සිළුමිණ රචනා කිරීම.

(20) දඹදෙනියේ දෙවන පරාක්‍රමබාහු රජු සම්බන්ධයෙන්

1. A හා B සත්‍ය වේ. 2. B හා C සත්‍ය වේ. 3. A හා D සත්‍ය වේ. 4. B හා D සත්‍ය වේ.

(21) B හා C ප්‍රකාශ වලින් දැක්වෙන්නේ දඹදෙණියේ කුමන පාලකයා පිළිබඳව ද?

1. තුන්වන විජයබාහු රජු 2. පළමුවන බුවනෙකබාහු රජු
3. හතරවන වියබාහු රජු 4. දෙවන පරාක්‍රමබාහු රජු

(22) මෙරට මව් පාර්ශවයෙන් රාජ්‍ය උරුමය සිදු වූ පාලන සමය මින් කුමක් ද?

1. අනුරාධපුරය පාලන සමය 2. පොළොන්නරු පාලන සමය
3. කුරුණෑගල පාලන සමය 4. ගම්පොල පාලන සමය

(23) පහත ඓතිහාසික සිදුවීම්වල නිවැරදි ඓතිහාසික අනුපිළිවෙල දැක්වෙන පිළිතුර කුමක්ද?

A මෙරට සියම් නිකාය ආරම්භ කිරීම B රාජාධිරාජසිංහ රජු මිය යාම
C කන්නසාමි කුමරු ශ්‍රී වික්‍රම රාජසිංහ නමින් රජවීම D මහනුවර දළදා මාලිගය ඉදිවීම.

1. DABC 2. ABCD 3. BCAD 4. CABD

(24) මහනුවර රාජධානී සමයේ රදළ ප්‍රධානීන්ගේ සේවය වෙනුවෙන් වෙන් කල ඉඩම් පහත කුමන නමකින් හැදින්වේද?

1. නින්ද ගම් 2. ගබඩාගම් 3. පරවේණිගම් 4. දේවාලගම්

(25) "සෙයිලන්"නමින් ශ්‍රී ලංකාව හදුන්වා ඇත්තේ පහත කුමන ජාතීන් විසින් ද?

1. මුස්ලිම්වරු 2. පෘතුග්‍රීසි 3. ලන්දේසී 4. ඉංග්‍රීසී

(26) ක්‍රි.ව 1638 ලන්දේසින් සමග ගිවිසුමක් ඇති කරගත් උඩරට පාලකයා කවුරුන්ද?

1. සෙනරත් රජු 2. දෙවනරාජසිංහ රජු
3. කීර්ති ශ්‍රී රාජසිංහ රජු 4. පලමුවන විමලධර්මසූරිය රජු

❖ ප්‍රශ්න අංක 27 -28 සඳහා පහත තොරතුරු සැලකිල්ලට ගන්න.

A ක්‍රි.ව 1803 ඉංග්‍රීසින් උඩරට ආක්‍රමණය කිරීම.
B ෆෙඩ්රික්නෝත් ප්‍රථම ඉංග්‍රිසී ආණ්ඩුකාර ලෙස පත්කර යැවීම.
C මුහුදුබඩ ප්‍රදේශවල ඉංග්‍රිසී විරෝධී කැරැල්ලක් ඇති වීම.
D ශ්‍රී ලංකාවේ මුහුදු බඩ ප්‍රදේශවල පාලනයට රෙසිඩන්ට්වරයෙක් පත්කර එවීම.

(27) මෙරට පෙරදිග ඉංග්‍රීසි වෙළඳ සමාගම (මදුරාසි) යටතේ පාලන කාලය තුල වූ සිදුවීම් දෙකක් ඇතුලත් පිළිතුර කුමක් ද?

1. A හා B 2. B හා C 3. C හා D 4. A හා D

(28) ශ්‍රී ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශ බ්‍රිතාන්‍ය කිරීටයේ පාලනයට යටත් වීමෙන් පසුව සිදුවූ සිදුවීමක් ඇතුලත් පිළිතුර කුමක්ද?

1. A සිදුවීම 2. B සිදුවීම 3. C සිදුවීම 4. D සිදුවීම

(29) මෙරට බෞද්ධ පුනර්ජීවනයට රුකුලක් වු මෙරට පිහිටවූ මුල්ම මුද්‍රණාලය වන්නේ මින් කුමක්ද?

1. සුදර්ශන මුද්‍රණාලය 2. සරසවි සදරුස මුද්‍රණාලය
3. ලංකාභිනව විශ්‍රැත මුද්‍රණාලය 4. ලංකෝපකාර මුද්‍රණාලය

(30) කෘෘමැකලම් ප්‍රතිසංස්කරණයේ සිදුවූ ප්‍රධාන දේශපාලන ප්‍රතිසංස්කරණයක් වන්නේ මින් කුමක් ද?

1. ප්‍රථම වරට සිටින ඡන්ද බලය හඳුන්වා දීම. 2. ව්‍යවස්ථාදායක සභාව පිහිටුවීම.
3. නාමික විධායකයක් ඇති කිරීම. 4. පළාත්බද නියෝජනය හඳුන්වා දීම.

(31) ඩොනමෝර් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණයේදී හඳුන්වා දුන් විධායක කාරක සභා අතර කෘෂිකර්ම හා ඉඩම් කාරක සභාවේ සභාපතිවරයා වූයේ මින් කවුරුන්ද?

1. සී.ඩබ්.ඩබ්. කන්නන්ගර මහතා 2. ආචාර්ය කොල්වින් ආර් ද සිල්වා මහතා
3. ඩඩ්ලි සේනානායක මහතා 4. ඩී.එස් සේනානායක මහතා

(32) නිදහසින් පසු මෙරට රබර් අපනයනය ඉහළ නැංවීම සඳහා ද්විපාර්ශවීය වෙළඳ ගිවිසුමක් ඇති කරගත් රාජ්‍ය කුමක්ද?

1. ඉන්දියාව සමඟ 2. චීනය සමඟ 3. ජපානය සමඟ 4. රුසියාව සමඟ

❖ පහත A B C හා D දක්වා ඇති එක් එක් යුගලයෙහි පළමු හා දෙවන අදහස් අතර සම්බන්ධතාවය පරීක්ෂා කර බලා අංක 33 - 35 දක්වා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A 1. සමාජ පන්ති
  2. කාර්මීකරණය

B 1. ජනගහනය
  2. නිෂ්පාදනය හා වෙළඳපල

C 1. සමාජවාදය
  2. ධනවාදය

D 1. නව අධිරාජ්‍යවාදය
  2. කම්කරු පංතිය

(33) දෙවැන්නේ වර්ධනයට පළමුවැනනේ වර්ධනය හේතුවන යුගලය,

1. A 2. B 3. C 4. D

(34) පළමුවැන්න ඇතිවීම කෙරෙහි දෙවැන්න හේතුවන බව දැක්වෙන යුගලය,

1. A 2. B 3. C 4. D

(35) එකිනෙක ප්‍රතිවිරුද්ධව ගමන් කරන යන අදහස ඇති යුගලය,

1. A 2. B 3. C 4. D

(36) පළමු ලෝක යුද්ධ සංග්‍රාමයෙන් පසු බිහිවූ ජාතීන්ගේ සංගමයේ සාමාජිකත්වය ලබානොගත් රට කුමක්ද?

1. සෝවියට් රුසියාව 2. ජර්මනිය
3. ජපානය 4. ඇමරිකා එක්සත් ජනපදය

(37) එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මූලස්ථාන ගොඩනැගිල්ල පිහිටි නගරය වන්නේ,

1. නිව්යෝර්ක් 2. වොෂින්ටන් 3. පැරිස් 4. ලන්ඩන්

(38) සමාජ සම්මුතිය නම් ග්‍රන්ථයෙන් ජනතා ස්වාධිපත්‍ය විග්‍රහ කරන ලද්දේ,

1. මොන්ටෙස්ක්‍යු 2. රූසෝ 3. ඒබ්‍රහම් ලින්කන් 4. වෝල්ටෙයාර්

(39) පළමු ලෝක යුද්ධයේ මධ්‍යම බලවතුන්ගේ පිලේ සිට රහස් ගිවිසුමක් මගින් මිත්‍ර පක්ෂයට එක් විය. එම රට කුමක් ද?

1. ඔස්ට්‍රියාව 2. තුර්කිය 3. ඉතාලිය 4. ප්‍රංශය

(40) දෙවන ලෝක සංග්‍රාම අවධියේ ඉතාලිය විසින් ආක්‍රමණය කළ අප්‍රිකානු රාජ්‍ය මින් කුමක් ද?

1. සෝමාලියාව 2. ඇබිසීනියාව 3. සුඩානය 4. මැඩගස්කරය

සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
අවසන් පෙරහුරු පරීක්ෂණය (2022-2023)

ඉතිහාසය 11 කාලය පැය තුනයි මිනිත්තු 10යි

★ I කොටසේ ප්‍රශ්න අංක 1 අනිවාර්ය වේ.
★ II කොටසින් ප්‍රශ්න 04 කට ද, III කොටසින් එක් ප්‍රශ්නයකට ද පිළිතුරු සපයන්න.
★ පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව හයකි.

## I කොටස

1. (අ) පහත i යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ල ම සපයා ඇති ලංකා සිතියමේ ද, ii යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ලම ලෝක සිතියම් කොටසෙහි ද ලකුණු කර නම් කරන්න.
   i. කිරිඳි ඔය / අඹන් ගඟ / වික්ටෝරියා ජලාශය / කන්තලේ වැව / බණ්ඩාරවෙල / පේද්‍රු තුඩුව / මඩකලපුව / ඇලහැර අමුණ / නල්ලූර් / ගම්පොල / වෙල්ලස්ස / දීඝවාපි
   ii. සූවස් ඇල / තායිලන්තය / ජිනිවා / අරාබි මුහුද / ක්‍රිෂ්ණා ගඟ / පිලිපීන් දූපත් (ල. 18)

   (ආ) පහත A, B, C, D යටතේ දක්වා ඇති ඓතිහාසික තොරතුරු හා සම්බන්ධ පුද්ගලයින් කවුරුන්දැයි අනුපිළිවෙලින් ලියන්න.
   A. පාණ්ඩ්‍ය රටට රැගෙන ගිය දළදා වහන්සේ නැවත මෙරටට ගෙන්වා පොළොන්නරුවේ සිට පාලන කටයුතු මෙහෙයවූ පාලකයා
   B. ක්‍රි.ව 1803 උඩරට ආක්‍රමණය කළ ඉංග්‍රීසි ආණ්ඩුකාරවරයා
   C. පුනරුද සමයේ "ලෝරාට සැහැලි කවි" කෘතිය රචනා කළ පුද්ගලයා
   D. කුඩා රාජ්‍යයන් එකතු කරමින් ජර්මනිය නම් රාජ්‍යයක් බිහි කිරීමට කටයුතු කළ නායකයා
   (ල. 4)

❖ A , B යටතේ ඇති පින්තූර අධ්‍යනය කර අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.



A

i. A පින්තූරයෙන් දැක්වෙන්නේ කුමක් ද?
ii. මෙය පිහිටියේ කුමන නගරයක් ආශ්‍රිතව ද?
iii. මෙය නිමවා ඇති මාධ්‍ය කුමක් ද?
iv. මෙයින් පිළිබිඹුවන්නේ අතීතයේ පැවති කුමන තාක්ෂණික ශිල්පීය ක්‍රමයක් ද? (ල. 4)



B

i. B පින්තූරයෙන් දැක්වෙන්නේ කවුරුන් ද?
ii. මොහු කුමන විප්ලවයක් වෙනුවෙන් නායකත්වය සපයන ලද්දේ ද?
iii. මොහු ක්‍රියාත්මක වූයේ කුමන දේශපාලන මතවාදයක් මුල්කර ගෙන ද?
iv. මොහු නායකත්වය ලබා දුන් එම විප්ලවය හා සම්බන්ධවූ රට විප්ලවයෙන් පසු හැඳින්වූයේ කෙසේ ද? (ල. 4)

## II කොටස

2.

i. ලංකාවට පැමිණ ඓතිහාසික කෘති රචනා කළ පහත කතුවරුන් අයත් රටවල් අනුපිළිවෙලින් ලියන්න.

a. රිබෙයිරෝ
b. රොබට් නොක්ස්
c. පිලිප්පස් බැල්දියස් (ල. 3)

ii. මෙරට අභිලේඛන ලියා ඇති මාධ්‍ය 4 ක් නම් කරන්න. (ල. 4)

iii. ලංකා ඉතිහාසය හැදෑරීමේ දී මහාවංශය මූලාශ්‍රයක් ලෙස වැදගත්වීමට හේතු දෙකක් නම් කර කෙටියෙන් විස්තර කරන්න. (ල. 5)

iv. පැරණි පුරාවස්තු රැක ගැනීමේ ඇති වැදගත්කම කරුණු 3ක් ඇසුරින් කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 6)

3.

i. පහත මූලාශ්‍ර මගින් අනාවරණය වන, පූර්ව රාජ්‍ය සමයේ පාලන කටයුතු හා සම්බන්ධව සිටි පුද්ගලයන් අනුපිළිවෙලින් නම් කරන්න.

A. කොත්ගල්කන්ද සෙල්ලිපිය
B. පෙරියපුලියන්කුලම සෙල්ලිපිය
C. මාතලේ කළුදිය පොකුණ සෙල් ලිපිය (ල. 3)

ii. පහත රාජ්‍යත්ව සංකල්ප භාවිතා කළ පාලකයින් අනුපිළිවෙළින් දක්වන්න.

a. චක්‍රවර්ති
b. පර්වතරාජ
c. නරඉසෙර
d. දේවත්ව (ල. 4)

iii. අතීතයේ රාජ්‍ය උරුමය සිදු වූ සම්ප්‍රදායන් දෙකක් නම්කර උදාහරණ ඇසුරින් කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 5)

iv. දුටුගැමුණු රජු මෙරට ඉතිහාසයේ වැදගත් පාලකයෙක් ලෙස හැඳින්වීමට බලපෑ ආර්ථික, ආගමික හා දේශපාලන හේතු 03 ක් කෙටියෙන් පැහදිලි කරන්න (ල. 6)

4.

i. මෙරට ක්‍රියාත්මකව පැවති දකුණු ඉන්දීය වෙළඳ සංවිධාන 03 ක් නම් කරන්න. (ල. 3)

ii. අතීතයේ මෙරට පැවති කෘෂිකර්මාන්තය සම්බන්ධයෙන් වන පහත a, b, c, d ප්‍රකාශ සඳහා පිළිතුරු අනුපිළිවෙලින් ලියන්න.

a. හේන් වගා කිරීම වෙනුවෙන් අය කළ බදු වර්ගයක්
b. "අහසින් වැටෙන එක දිය බිඳක්වත් ප්‍රයෝජනයට නො ගෙන මුහුදට යාමට ඉඩ නොදිය යුතු යි". යන ප්‍රකාශය කළ පාලකයා
c. පැරණි සෙල්ලිපිවල "පිටිබිම" ලෙස දක්වා ඇති ගොවිතැන් ක්‍රමය
d. අතීතයේ ගව පාලනය සඳහාම වෙන් වූ ගම් හැඳින්වූ නාමය (ල. 4)

iii. අතීත පාලකයන් විදේශ රාජ්‍යයන් සමඟ පැවැත්වූ සම්බන්ධතාවයන්හි ආකාර දෙකක් නම් කර උදාහරණ ඇසුරින් විස්තර කරන්න. (ල. 5)

iv. අතීත ශ්‍රී ලංකාවේ ආර්ථික කටයුතු අතර කර්මාන්ත අංශයට වැදගත් තැනක පැවති බව උදාහරණ 03 ක් ඇසුරින් කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 6)

5. i. මහනුවර රාජධානිය සම්බන්ධ පහත A, B, C ප්‍රකාශවලට අදාළ පිළිතුරු අනුපිළිවෙලින් ලියන්න.

A. මහනුවර රාජධානිය හැඳින් වූ වෙනත් නමක්

B. පළමු වන විමලධර්මසූරිය රජු උඩරට රජ වීමට පෙර හැඳින්වූ නම

C. උඩරට නායක්කර් රාජවංශයේ මුල් ම පාලකයා (ල. 3)

ii. මහනුවර රාජධානිය සම්බන්ධ පහත සිදුවීම්වලට අදාළ පාලකයින් වරහන් තුළින් තෝරා ලියන්න.

A. මෙරට කපු වගාව දියුණු කිරීමට කටයුතු කිරීම

B. කි.ව 1638 ලන්දේසීන් සමග ගිවිසුමක් ඇතිකර ගැනීම.

C. උඩරට සිංහල වංශයේ අවසන් සිංහල රජතුමා

D. ඉංග්‍රීසින් ලංකාවේ මුහුදු බඩ ප්‍රදේශවල බලය අල්ලා ගන්නා අවධියේ උඩරට පාලකයා

(ශ්‍රී වික්‍රම රාජසිංහ, කීර්ති ශ්‍රී රාජසිංහ, පළමු විමලධර්මසූරිය, දෙවන රාජසිංහ, ශ්‍රී වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ)

(ල. 4)

iii. මහනුවර රාජධානියේ ප්‍රාදේශීය පාලනය සිදුවූ අකාරය එහි ප්‍රධාන අංශ දෙක ඇසුරෙන් කෙටියෙන් පැහැදිළි කරන්න. (ල. 5)

iv. උඩරට රාජධානිය සම්බන්ධ ලන්දේසීන්ගේ ප්‍රතිපත්තිවල කැපී පෙනෙන ලක්ෂණ 03 ක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 6)

6.

i. ලන්දේසි පාලන සමයේ මෙරටට පැමිණි ඉංග්‍රීසි දූත කණ්ඩායම් 03 ක් නම් කරන්න. (ල. 3)

ii. මෙරට මුහුදුබඩ ප්‍රදේශවල බ්‍රිතාන්‍ය පාලන කටයුතු සම්බන්ධ පහත සිදුවීම්වලට අදාළ පිළිතුරු a, b, c, d අනුපිළිවෙළින් ලියන්න.

a. බ්‍රිතාන්‍යයන් විසින් මුලින්ම අත්පත් කරගත් වරාය

b. කිව් ලිපිය අත්සන් කරන සමයේ මෙරට සිටි ලන්දේසි ආණ්ඩුකාරවරයා

c. මෙරට බ්‍රිතාන්‍ය පාලන කටයුතු සම්බන්ධ මුල්ම බ්‍රිතාන්‍ය ආණ්ඩුකාරවරයා

d. මෙරට උඩරට ප්‍රදේශ ඉංග්‍රීසින් අත්පත් කරගන්නා අවධියේ උඩරට පාලකයා

(ල. 4)

iii. ඉංග්‍රීසින් ශ්‍රී ලංකාව කෙරෙහි අවධානය යොමු කිරීමට බලපෑ හේතු දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 5)

iv. බ්‍රිතාන්‍ය පාලන සමය තුළ මෙරට ඇති වූ ආර්ථික හා සමාජ ප්‍රතිඵල 03 ක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 6)

7.

i. දේශපාලන වශයෙන් ඇති කළ කෝල්බෲක් ප්‍රතිසංස්කරණ යෝජනා 03 ක් නම් කරන්න. (ල. 3)

ii. පහත සඳහන් වෙනස්කම් සිදු වූ ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ වරහන් තුළින් තෝරා ලියන්න.

a. රාජකාරි ක්‍රමය අහෝසි වීම
b. සර්වජන ඡන්දබලය හිමි වීම
c. අග්‍රාණ්ඩුකාර ධූරය පිහිටුවීම
d. පළාත් බද නියෝජන ක්‍රමය හඳුන්වාදීම

(මැනිං ප්‍රතිසංස්කරණය, කොල්බෲක් ප්‍රතිසංස්කරණය, කැමරන් ප්‍රතිසංස්කරණය, ඩොනමෝර් ප්‍රතිසංස්කරණය, සෝල්බරි ප්‍රතිසංස්කරණය, කෲව් මැකලම් ප්‍රතිසංස්කරණය)

(ල. 4)

iii. (අ) නිදහස ලැබීමට පෙර මෙරට ඇති කළ ගොවි ජනපද ව්‍යාපාර දෙකක් නම් කරන්න.
(ආ) මහවැලි සංවර්ධන ව්‍යාපාරයේ අපේක්ෂිත අරමුණු 03 ක් ලියන්න. (ල. 5)

iv. නිදහස ලබා ගැනීමෙන් පසු බලයට පත් රජයන් විසින් සමාජ සුබ සාධනය සඳහා ගත් ක්‍රියාමාර්ග 03 ක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 6)

## III කොටස

8.

i. යුරෝපයේ පුනරුදය ඇති වීමට බලපෑ හේතු 03 ක් නම් කරන්න. (ල. 3)

ii. පහත සිදුවීම්වලට සම්බන්ධ පුද්ගලයින්ගේ නම a, b, c, d ,අනුපිළිවෙලින් ලියන්න.

a. මුලින්ම ඉන්දියාවේ කැලිකට් වරායට ගොඩබැසීම
b. මුලින්ම පිලිපීන් දූපත් සොයාගැනීම
c. මුලින්ම සුභ පැතීමේ තුඩුවට පැමිණීම
d. මුලින්ම බහමාස් දූපත්වලට ගොඩබැසීම (ල. 4)

iii. කාර්මික විප්ලවය නිසා කෘෂිකාර්මික හා ප්‍රවාහන ක්ෂේත්‍රයේ සිදු වූ දියුණුව උදාහරණ දෙකක් ඇසුරෙන් කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 5)

iv. කාර්මික විප්ලවය ලංකාව කෙරෙහි බලපෑ ආකාරය උදාහරණ 03 ක් මඟින් කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 6)

9.

i. පහත විප්ලවයන් ඇතිවීමට බලපෑ ආසන්නම සිදුවීම් A, B,C අනුපිළිවෙලින් ලියන්න.

a. ඇමරිකානු නිදහස් සටන
b. රුසියන් විප්ලවය (මාර්තු විප්ලවය)
c. ප්‍රංශ විප්ලවය (ල. 3)

ii. රුසියන් විප්ලවයේ හා ප්‍රංශ විප්ලවයේ ගෝලීය බලපෑම් එක බැගින් වෙන් වෙන්ව ලියන්න. (ල. 4)

iii. පළමු ලෝක සංග්‍රාමයට බලපෑ හේතු දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 5)

iv. දෙවන ලෝක සංග්‍රාමයේ ප්‍රතිඵල තුනක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 6)

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# ඉතිහාසය II

# පිළිතුරු පත්‍රය

1.(ආ) A - III වන පරාක්‍රමබාහු රජු

B - සර් ෆෙඩ්රික් නෝත්

C - පෙට්‍රාක්

D - ඔටෝවෝන් බිස්මාක්

A රූපය

I. පාලමක්/ගල් පාලම/මල්වතුඔයේ පැරණි ගල් පාලම
II. අනුරාධපුර නගරය
III. කළු ගල්
IV. මහා මාර්ග කැනීමේ තාක්ෂණය/පාලම් ඉදිකිරීමේ තාක්ෂණය

B රූපය

I. වී.අයි.ලෙනින්
II. ප්‍රංශ විප්ලවය
III. කොමියුනිට්ස් වාදය
IV. සෝවියට් සමාජවාදී සමූහාණ්ඩු සංගමය

2. I. A පෘතුගාලය

B බ්‍රිතාන්‍ය

C ඕලන්දය

II. ගල් (ශිලා), තඹ තහඩු, රන් තහඩු, දැව, බිත්ති, දැව, මැටි පුවරු, භාජන.

III. විශ්වසනීය කෘතියක් වීම. (අනෙකුත් මූලාශ්‍ර මගින් තොරතුරු තහවුරු වීම, අකණ්ඩ ලිඛිත ඉතිහාසයක් රචනා කර තිබීම, මෙරට ආර්ථික, දේශපාලන, ආගමික හා සමාජීය තොරතුරු එකම කෘතියකින් ආවරණය වීම) (කරුණු 2 කට ලකුණු 2යි.විස්තරයට ලකුණු 3යි)

IV. - අනාගත පරම්පරාවට දැක බලා ගැනීමට අධ්‍යනය කිරීමට.

- සංචාරක කටයුතු සම්බන්ධ වැදගත් වීම.
- අතීත දේශීය තාක්ෂණය මෙමගින් අනාවරණය කරගැනීමට හැකිවීම.
- වර්තමාන සංවර්ධන කටයුතු නිසා මේවා විනාශයට පත් වීම.
- මෙරට අතීත ශ්‍රී විභූතිය අනන්‍යතාවය ජාතික අභිමානය මේවා මගින් තහවුරු වීම ආදී පුරාවිද්‍යා මූලාශ්‍ර විනාශ වන ක්‍රම හා ඒවායේ වැදගත්කම තහවුරු වන කරුණු 3ක් සඳහා ලකුණු 3යි, විස්තරයට ලකුණු 3යි)

3. I. A පරුමකවරු පිළිබඳව

B ගහපතීන් පිළිබඳව

C ගමිකයින් පිළිබඳව

II. A - නිශ්ශංකමල්ල රජු

B - පළමුවන කාශ්‍යප රජු

C - කූටකණ්ණ අභය රජු

D - මහසෙන් රජු

III. - පියාගෙන් පුතාට උරුම වීම. උදා:- කාවන්තිස්ස රජුගෙන් පසු දුටුගැමුණු රජු, වසභ රජුගෙන් පසු වංකනාසිකතිස්ස රජු.

- සහෝදරයාගෙන් ඊලග වැඩිමල් සහෝදරයාට උරුම වීම. උදා:- දේවානම්පියතිස්ස රජුගෙන් පසු උත්තිය, මහාශිව, සූරතිස්ස, අසේල ආදී ලෙස, දුටුගැමුණු රජුගෙන් පසු සද්ධාතිස්ස රජුට හිමි වීම ආදී උදාහරණ 2 ට ලකුණු 2යි, විස්තරයට ලකුණු 3 යි.

IV. - මුල්වරට සංවිධානාත්මක සටන් ව්‍යාපාරයක් මගින් ලංකාව එක්සේසත් කිරීම (ද්‍රවිඩ පාලනයෙන් අනුරාධපුරය බේරා ගැනීම)

- රුවන්වැලිසෑය ඇතුළු වෙහෙර විහාර කරවීම (බුදු සසුන නගා සිටුවීම)
- භික්ෂූන් වහන්සේලා වෙනුවෙන් කළ සේවය.
- ජාත්‍යන්තර වෙළඳ වරායක් ලෙස වැදගත් වූ මාතොට වරාය පරසතුරන්ගෙන් බේරා ගැනීම.
- මධ්‍යගත පාලනය විධිමත් කිරීම.
- පරුමකවරුන් ලෙස කටයුතු කල ප්‍රාදේශීය නායකයින්ට රජයේ ඉහළ තනතුරු ලබාදීම.ආදී ආර්ථික, දේශපාලන හා සමාජීය තොරතුරු සඳහා උදාහරණ 03 ට ලකුණු 3යි,විස්තරයට ලකුණු 03යි.

4. I. නානාදේසීන්, වලඤ්ජියාර්, අයින්නූරුවර්.

II. A - කැති අඩ, කෙටු කනබ

B - පළමුවන පරාක්‍රමබාහු රජු

C - හේන් වගාව

D - ගෝපාලගම

III. රාජ්‍ය තාන්ත්‍රික සම්බන්ධතා

- පලමු ගජබා රජු ඉන්දියාවේ චේර රාජ්‍යයේ පත්තිනි දේවාලයක් විවෘත කිරීමේ උත්සවයකට සම්බන්ධ වීම.
- භාතිකාභය රජු රෝමානු දේශයෙන් වීදුරු පබළු ගෙන්වා රුවන්වැලිසෑයට පූජෝපහාර දැක්වීම.
- හයවන අග්බෝ රජු චීනයට විසිවතාවක් තානාපතිවරු යැවීම.

විවාහ සම්බන්ධතා

- පළමු විජයබාහු රජු තිලෝකසුන්දරී නම් කාලිංග කාන්තාවක් විවාහ කර ගැනීම, තම සොහොයුරිය මිත්තා කුමරිය පාණ්ඩ්‍ය කුමාරයකුට ආවාහ කර දීම.
(මෙසේ වර්ග කර නොදක්වා උදාහරණ සපයා ඇත්නම් ලකුණු ලබා දෙන්න.උදාහරණ 2 ට ලකුණු 2 යි. විස්තරයට ලකුණු 3 යි)

IV. - ලෝහ කර්මාන්තය:- යකඩ (මජ්ජිම නම් කම්මල් කරුවෙකු පිළිබඳ පොලොන්නරුව මුතුගල්ල සෙල්ලිපියේ දැක්වේ)

- රන් කර්මාන්තය (තුලධර)
- මැටි කර්මාන්තය (කුබකර)
- තඹ කර්මාන්තය (තඹකර)
- රෙදි පිළි කර්මාන්තය (තතවය)
- මැණික් කර්මාන්තය (මණිකර)
- ඇත්දත් කර්මාන්තය (දටික සුමණ)
(උදාහරණ 3 ට ලකුණු 3 යි, විස්තරයට ලකුණු 3 යි)

5.I. A  උඩරට රාජධානිය, ගඟසිරිපුර, සෙංකඩගල, කන්දෙ නුවර.

B කොනප්පු බණ්ඩාර

C ශ්‍රී විජය රාජසිංහ

II. A - පලමු විමලධර්මසූරිය රජු

B - දෙවන රාජසිංහ රජු

C - ශ්‍රී වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ රජු

D - රාජාධිරාජසිංහ රජු

III.
- කලට වේලාවට භාණ්ඩ ලබා ගැනීමට නොහැකි වීම.
- අධික ලෙස තීරුබදු අය කළ නිසා වැඩිමිලට භාණ්ඩ ලබා ගැනීමට සිදුවීම.
- ප්‍රමාණවත් තරම් භාණ්ඩ නොලැබීම.
- වෙළඳ මාර්ග (ගොඩබිම්, මුහුදු) භාවිතා කිරීමට බාධා ඇති වීම.
- යුරෝපයේ ඉහළ ඉල්ලුමක් පැවති වටිනා කුළුබඩු ලබා ගැනීමට බාධා ඇති වීම.

(ආදී උදාහරණ 2 ට ලකුණු 2 යි,විස්තරයට ලකුණු 3 යි)

IV.
- උඩරට සමඟ ලන්දේසීන් සාමකාමීව කටයුතු කිරීම. (ගැටුම් ඇතිකර ගැනීම ලන්දේසීන්ට පාඩු සිදුවීම)
- උඩරට රජු සමඟ තෑගි බෝග හුවමාරු කරගැනීම. (රජු සමඟ හොඳහිත දිනා ගැනීමට කටයුතු කිරීම)
- උපසම්පදාව ගෙන ඒමට රජුට සහාය දැක්වීම. (ලන්දේසී නැව් ලබා දීම :- දෙවන විමලධර්මසූරිය රජුට, ශ්‍රී විජය රාජසිංහ රජුට, කීර්ති ශ්‍රී රාජසිංහ රජුට)
- උපරිම ආර්ථික වාසි ලබා ගැනීමට කටයුතු කිරීම.
- වී වගාව දියුණු කිරීමට කටයුතු කිරීම.
- කුරුඳු වගාව දියුණු කිරීම, උක් වගාව, කෝපි, කපු වැනි වගාවන් කරවීමට කටයුතු කිරීම.
-

6.I. - ජෝන් පයිබස් (1762)

- හියුබොයිඩ් (1782)
- රොබට් ඇන්ඩෲස් (1795)

II. A - ත්‍රිකුණාමලය

B - ෆන් එංගල්බෙග්

C - සර් ෆෙඩ්රික් නෝත්

D - ශ්‍රී වික්‍රම රාජසිංහ රජු

III. ශ්‍රී ලංකාවේ පිහිටීමේ වැදගත්කම
- ස්වාභාවික වරායක් වූ ත්‍රිකුණාමලය වරාය පිහිටීම.
- ඉන්දියානු සාගරයේ මධ්‍යගතව පිහිටීම.
- ඉන්දියාවෙන් වෙන්ව දූපතක් ලෙස පිහිටීම.
- පෙර අපර දෙදිග වෙළඳ මාර්ගයේ සංධිස්ථානයක් වීම.

වෙළඳ කටයුතුවලට වැදගත්වීම
- කුරුඳු ඇතුළු කුළුබඩු වර්ග, ඇත්දළ මුතු මැණික්.
- (ආදී උදාහරණ 2 ට ලකුණු 2 යි, විස්තරයට ලකුණු 3 යි)

IV. ආර්ථික

- වතු වගාව දියුණු වීම.
- ආනයන අපනයන ආර්ථික ක්‍රමයක් බිහිවීම.
- දේශිය ස්වයංපෝෂිත ආර්ථික රටාව බිඳ වැටීම.
- මහා මාර්ග, දුම්රිය මාර්ග, සන්නිවේදන කටයුතු, ප්‍රවාහන ආදි යටිතල පහසුකම් දියුණු වීම.

සමාජීය

- පන්ති සහිත සමාජයක් බිහිවීම. (මධ්‍යම, කම්කරු)
- ඉංග්‍රීසි අධ්‍යාපනය දියුණු වීම.
- කතෝලික ආගම ජනගත වීම.
- බටහිර සංස්කෘතිය සමාජය තුළ මුල්බැස ගැනීම.
- දේශීය සිරිත් විරිත් පිරිහීමට ලක් වීම.
- රාජකාරී ක්‍රමය අහෝසි වීම.
- ගම් සභා බිඳ වැටීම.

(ආදී උදාහරණ 3 ට ලකුණු 3 යි,විස්තරයට ලකුණු 3 යි)

7.I. - ව්‍යවස්ථාදායක හා විධායක සභා පිහිටුවීම.

- ශ්‍රී ලංකාව පළාත් 05 කට බෙදීම.
- උඩරට හා පහතරට ඒකාබද්ධ කිරීම.
- ජනවාර්ගික නියෝජන ක්‍රමය මත නියෝජිතයන් තෝරා ගැනීම.
- ආණ්ඩුකාරවරයාගේ බලතල අධික වීම.

II. A - කෝල්බෲක් කැමරන් ප්‍රතිසංස්කරණය

B - ඩොනමෝර් ප්‍රතිසංස්කරණය

C - සෝල්බරි ප්‍රතිසංස්කරණය

D - මැනිං ප්‍රතිසංස්කරණය

III. (අ) මින්නේරිය, නාච්චදූව, මිණිපේ, පරාක්‍රම සමුද්‍රය, රිදී බැඳි ඇල

(ආ) - ග්‍රාමීය ජනාවාසකරණය, ජලවිදුලිබල උත්පාදනය, වී වගාවට ජලය සැපයීම, ධීවර කර්මාන්තය නඟා සිටුවීම, ආහාර බෝග වගාව දියුණු කිරීම, ගංවතුර පාලනය

(විස්තර කිරීම අවශ්‍ය නොවේ)

IV.

- ග්‍රාමීය ප්‍රදේශවල අධ්‍යාපනය දියුණු කිරීම.
- රැකියා ලබාදීමට කුසලතාවය අනුව සිදු කිරීම.තරග විභාග පැවැත්වීම.
- නිදහස, සමානාත්මතාව, අයිතිවාසිකම් ආදිය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ඇතුලත් කිරීම.
- කෘෂිකාර්මික හා ධීවර කටයුතුවලට ණය හා සහනාධාර ලබාදීම.
- සෞඛ්‍ය පහසුකම් දියුණු වීම.
- ග්‍රාමීය යටිතල පහසුකම් නඟා සිටුවීම.
- ග්‍රාමීය දරිද්‍රතාවය අවම කිරීමට කටයුතු කිරීම.

(කරුණු 3 ට ලකුණු 3 යි,විස්තරයට ලකුණු 3 යි)

## III කොටස

8.I. - කොන්ස්තන්තිනෝපල් නගරය තුර්කීන් අතට පත්වීම (1453)
- වෙළඳාමේ දියුණුව.වෙළඳ නගර බිහිවීම.
- බුද්ධි ප්‍රබෝධය

II. A - වස්කෝ ද ගාමා
B - ෆර්ඩිනන්ඩ් මැගලන්
C - බර්තෝලමියුඩයස්
D - ක්‍රිස්ටෝපර් කොලොම්බස්

III. කෘෂිකාර්මික
- අශ්වයන් බදින ලද නගුල්වලින් පේලියට වැපිරීමේ ක්‍රමයක් හඳුන්වා දිම.
- ශෂ්‍ය මාරු ක්‍රමය භාවිතා කිරීම.
- මහා පරිමාණ ගොවි බිම් ඇති වීම.
- ගුවානෝ පොහොර විශේෂය හඳුන්වා දීම, කෘමිනාශක, වල් නාශක භාවිතය.
- සත්ත්ව පාලනයට අභිජනන ක්‍රම හඳුන්වා දීම.

ප්‍රවාහන
- මෝටර් රථය (ඩෙම්ලර්) ගුවන් යානය (රයිට් සහෝදරයෝ) දුම් බෝට්ටුව (රොබට් පුල්ටන්) දුම් නැව (හෙන්රි බෙල්) සොයා ගැනීම.
- මාර්ග තැනීමට මැකඩම් ක්‍රමය භාවිත කිරීම.
(ආදී උදාහරණ 2 ට ලකුණු 2 යි,විස්තරයට ලකුණු 3 යි)

IV.
- වතු වගාවට යන්ත්‍ර සූත්‍ර භාවිතා කිරීම.
- සමාජ පන්ති බිහි වීම.
- ධනවාදී ආර්ථික රටාවක් බිහි වීම.
- දුම්රිය මාර්ග මහා මාර්ග ඉදි විම.
- වෙළඳ කටයුතු මුල් කරගෙන නගර බිහි වීම.
- සන්නිවේදන ක්‍රමවල දියුණුව.

(උදාහරණ 3 ට ලකුණු 3 යි,විස්තරයට ලකුණු 3 යි)

9.I. A - බොස්ටන් තේ සාදය
B - රෙදි කම්මලක ඇති වූ වැඩ වර්ජනය
C - බැස්ටීල් සිර මැදිරියට පහර දීම

II. රුසියන් විප්ලවය
- සමාජවාදය ලොව පුරා ව්‍යාප්ත වීම.
- සමාජ පන්ති විෂමතා අවම කිරීමට ලෝකයේ රටවල් ක්‍රියා කිරීම.

ප්‍රංශ විප්ලවය
- මූලික මිනිස් අයිතිවාසිකම් ලොව පුරා ව්‍යාප්ත වීම.
- සමාජ සාධාරණත්වය වෙනුවෙන් රටවල් කටයුතු කිරීම.

III. - ජර්මනිය එක්සත් කිරීමේ ව්‍යාපාරයේ දී ප්‍රංශය හා ජර්මනිය සතුරන් බවට පත් වීම.
- ජර්මනියේ දෙවන විලියම් රජුගේ ක්‍රියා කලාපය.
- යටත් විජිත සඳහා තරගය.
- අවි තරගය හා ජාතිවාදය වර්ධනය වීම.
- ඔස්ට්‍රියාවේ ඔටුන්න හිමි කුමරුගේ ඝාතනය.

(උදාහරණ 2 ට ලකුණු 2 යි, විස්තරයට ලකුණු 3 යි)

IV. - මිත්‍ර පක්ෂයට ජය අත්වීම.අක්ෂ පක්ෂය පරාජය වීම.
- මිනිස් ජීවිත හා දේපල විශාල ලෙස විනාශ වීම.
- හිට්ලර්ගේ ක්‍රියා කලාපයට අනුව යුදෙව්වන් විශාල වශයෙන් ඝාතනය වීම.
- පරමාණු බෝම්බ යුධ අවියක් ලෙස භාවිතයට ගැනීම.
- ලෝක බලවතුන් ලෙස සිටි ප්‍රංශය, බ්‍රිතාන්‍ය වැනි රටවලට එම තත්වය අහිමි වීම.
- මාර්ෂල් සැලැස්ම ක්‍රියාත්මක කිරීම (පරාජිත රටවල් නගා සිටුවීම).
- ධනවාදී හා සමාජවාදි ලෙස ප්‍රධාන බල කඳවුරු දෙකක් නිර්මාණය වීම.

(උදාහරණ 3 ට ලකුණු 3 යි,විස්තරයට ලකුණු 3 යි)